Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය :- ....................................................... කාලය: පැය 02 යි.

### I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) කිසියම් අවස්ථාවකට ගැළපෙන පරිදි යොදා ගන්නා පැරණි කියමන් හඳුන්වන්නේ,
   1) යුගල පද ලෙසයි.  2) විශේෂණ පද ලෙසයි.
   3) ප්‍රස්තාව පිරුළු ලෙසයි.  4) ජනප්‍රවාද ලෙසයි.

02) 'ගඟට ඉනි කැපුවා වගේ ' යන පිරුළට ගැළපෙන අදහස වන්නේ,
   1) කපටි ක්‍රියාවක් බවයි.  2) අපරික්ෂාකාරී ක්‍රියාවක් බවයි.
   3) පාඩුවක් සිදු වූ බවයි.  4) අසාර්ථක ක්‍රියාවක් බවයි.

03) 'ඉහේ මලක් පිපුණි' යන රූඪී පදයෙහි අර්ථය දෙන අදහස තෝරන්න.
   1) උත්සවයකට සැරසෙන බවයි.  2) බලාපොරොත්තු ඉටු වූ බවයි.
   3) සිතේ ඇති වූ සතුටයි.  4) ඔළුවේ මලක් ගසා ඇති බවයි.

❖ හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න

04) ......................... වේලාසනින් ම පුස්තකාලයට ගියෙමි.
   1) ඇය  2) අපි  3) මම  4) ඔහු

05) ........................ අම්බලමේ ගිමන් හැරියෝ ය.
   1) මඟීහු  2) මඟීන්  3) මඟියා  4) මඟියා විසින්

06) ගුරුතුමිය ගීයක් .......................................
   1) ගැයුවේ ය.  2)ගැයුවා ය.  3) ගැයූහ.  4) ගැයුවෙමු.

❖ අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

07) 1) විශේෂණ  2) විශේසණ  3) විශේශන  4) විශේෂන

08) 1) ඖෂධ  2) ඖෂද  3) ඖෂද  4) ඖෂධ

09) 1) ඍජුකෝනය  2) රිජුකෝණය  3) ඍජුකෝණය  4)ඍජුබෝනය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

❖ ප්‍රශ්න අංක 10 සිට 12 දක්වා ප්‍රශ්නවල පද තුනක් අර්ථයෙන් සමානය. සමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.

10) 1) හිරු 2) දිනකර 3) සොමි 4) දිනමිණ

11) 1) ගස 2) ලිය 3) රුක 4) වෘක්ෂය

12) 1) ප්‍රාසාදය 2) මන්දිරය 3) පිළිමය 4) මැඳුර

❖ සිංහල අක්ෂර මාලාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

13) නූතන සිංහල වර්ණ මාලාවේ සඤ්ඤක අක්ෂර ගණන කීයද?

1) 10 යි. 2) 5 යි. 3) 18 යි. 4) 3 යි.

14) සිංහල වර්ණ මාලාවේ ව්‍යඤ්ජන අක්ෂර ගණන වන්නේ,

1) 54 2) 60 3) 42 4) 52

15) මහප්‍රාණ අක්ෂරයක් යෙදී නැති වචනය තෝරන්න.

1) ආශ්චර්යය 2) අනුරාධපුරය 3) සෞඛ්‍යය 4) විභීෂණ

16) ස්වරයකින් ආරම්භ වී ඇති වචන තෝරන්න.

1) සම්මන්ත්‍රණය 2) ගොවියා 3) චන්ද්‍රයා 4) ඒදණ්ඩ

17) 'මග දිගට ජනකතා' කෘතිය මහනුවර ප්‍රදේශයේ ප්‍රචලිත පුරාවෘත්ත හා බැඳුණු ජන කතා සංග්‍රහයකි. එය රචනා කළේ කවුද?

1) කුමාරතුංග මුනිදාස 2) මාර්ටින් වික්‍රමසිංහ

3) ඩී. පී . වික්‍රමසිංහ 4) කේ. ජයතිලක

18) නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකට ලේඛකයෙකු වන කේ. ජයතිලක මහතාගේ ස්වයං චරිතාපදානය වන්නේ, 1) නොනිමි සිත්තම 2) පුංචිරාළ

3) පුංචි පැළේ ගස වෙනා 4) චරිත තුනක්

19) "පයිං ඇවිදිල්ලා මහන්සි ද මන්දා" මෙම ප්‍රකාශය ඇතුළත් වේදිකා නාට්‍යය කුමක් ද?

1) කුවේණි 2) සිංහබාහු

3) තොප්පි වෙළෙන්දා 4) නරිබෑනා

20) දත් කැකුළු පාලා
සුරතල් සිනා සීලා
බොළඳ බස් දීලා
කෙළී සියොලඟ දූලි ගාලා

මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

1) ගුත්තිල කාව්‍ය 2) සිරිත් මල් දම 3) කාව්‍යශේඛරය 4) සුභාෂිතය

( ලකුණු 2 x 20 = 40 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන **150 කට නොඅඩු** රචනාවක් ලියන්න.

i) පොත් කියවමු දැනුම ලබමු.
ii) සුන්දර පරිසරයේ අසිරිය විඳිමු.
iii) යහපත් සෞඛ්‍ය පුරුදු පිළිපදිමු.
iv) ලෝකෙන් උතුම් රට ශ්‍රී ලංකාවයි.
v) සියලු ජාතීන් සමඟ එකමුතුව ජීවත් වෙමු. ( ලකුණු 20 )

02) ඔබේ පාසලෙන් ස්ථාන මාරුවක් ලබා වෙනත් පාසලකට ගිය සිංහල විෂය භාර ගුරුතුමාට/ ගුරුතුමියට ලියන පෞද්ගලික ලිපිය ලියන්න. ( ලකුණු 10 )

03) පහත සඳහන් කාව්‍ය නිර්මාණ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

මල් රොනට බඹරු වඩිනා
ලිය මඬුළු තිබද තිලනා
ඇල් පවන ගිමන නිවනා
නිල් දෙරණ වාසනාවන්

ගල් කුළෙන් කුළට හැපෙනා
දුල් රිදී දියෙන් සොබනා
දිය කඳුරු ගලා බසිනා
නිල් දෙරණ වාසනාවන්

තුරු සිරස අරා සිටිනා
සොඳ බටිති මලිති නොමිනා
යස මිහිරි සිංදු කියනා
නිල් දෙරණ වාසනාවන්

කෙළි මතින් ඉපිල පිහිනා
නෙක දණ්ඩි පැටව් නටනා
දිය කඩිති සිඳී නොයනා
නිල් දෙරණ වාසනාවන්

i) මල්වලින් රොන් ගන්නේ කවුද?
ii) රිදී පැහැයෙන් බබළන්නේ කුමක් ද?
iii) මිහිරි සින්දු කියන්නෝ කවරහු ද?
iv) අවසාන කවියේ සඳහන් වන පරිදි පරිසරයේ සුන්දර බව කියැවෙන කරුණු 02ක් ලියන්න.
v) දෙරණ, පවන යන පදවලට සමානාර්ථ පදය බැගින් ලියන්න. (ලකුණු 2 x 5 = 10)

04) පහත සඳහන් ප්‍රකාශයන් කවුරුන් විසින්, කාහට ප්‍රකාශ කරන ලද ද?, කුමන පාඩමේ ද? යන්න වගුවෙහි සටහන් කරන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් | කා හට | පාඩමේ නම |
|---|---|---|---|
| 1. "මම මහනුවර අසල ගම්වැසියෙක්මි. මගේ භාර්යාව සහ දරුවෝ මන්දාරම් නුවර වෙසෙති." | | | |
| 2. "හනික, හනික බලා ඉන්ට කල් නෑ. අප හැමෝම බඩගින්නේ " | | | |
| 3. "එසේය පැනුත් බොම්හ. තොප වසඟයටත් නොපැමිණෙම්හ. | | | |
| 4. "ගමින් ඇවිදිල්ලා - ගමින් ඇවිදිල්ලා. කැවුම් කෙහෙලුත් බො අරන් ඇවිදිල්ල." | | | |
| 5. "මෙන්න මේ වගේ තමා වාක්‍ය රචනා ලියන්නෙ." | | | |

(ලකුණු 3 x 5 = 15)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05) පහත සඳහන් උක්ත පද යොදා අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.

i) මිනිස්සු ............................................................

ii) අපි ............................................................

iii) ගුරුවරයා ............................................................

iv) ඔවුහු ............................................................

v) තෝ ............................................................

(ලකුණු 1 x 5 = 05)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය- පිළිතුරු

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01) | 3 | 06) | 2 | 11) | 2 | 16) | 4 |
| 02) | 4 | 07) | 1 | 12) | 3 | 17) | 3 |
| 03) | 3 | 08) | 4 | 13) | 2 | 18) | 3 |
| 04) | 3 | 09) | 3 | 14) | 3 | 19) | 4 |
| 05) | 1 | 10) | 3 | 15) | 1 | 20) | 3 |

(ල 2 x 20 = 40)

II - කොටස

1) රචනාව
i) සංවිධානය හා නිර්මාණාත්මක බව - 10
ii) සාරවත්බව හ මාතෘකාවට අදාළ බව - 05
iii) ශිල්පීය දක්ෂතා හා ඡේද වෙන් කිරීම - 05
20

2) පෞද්ගලික ලිපිය
i) ආකෘතිය - 05
ii) අන්තර්ගතය - 03
iii) ශිල්පීය දක්ෂතා - 02
10

3)
i) බඹරු
ii) දිය කඳුරු
iii) බටිති, මලිති
iv) දණ්ඩි පැටව් කෙළි මතින් පිහිනා යාම, දිය කඳුරු සිඳී නොයාම.
v) දෙරණ – භූමිය/පොළොව/වසුන්දරා ආදී
පවන – සුළඟ/නල ආදී සමාන පද

(ල 2 x 5 = 10)

4)
i) රජතුමා - මුරකරුට. රාසිං දෙයියන්ට බැණ වැදුණ මුරකරුවා.
ii) පොරමොලා - ගමා හා කායිරාට. විංචෙං චුලගෙං යමු කිරි නැනෝ
iii) බෝසතාණෝ - දියරකුසාට. නළපාන ජාතකය
iv) නරියා විසින් ගම දුවට. නරි බෑනා නාට්‍යය
v) ජයසේකර මහතා - ජයතිලකට. පුංචි පැලේ ගස වෙනා

(ල 3 x 5 = 15)

5) උක්තාඛ්‍යාත පද සම්බන්ධය නිවැරදි, අර්ථවත් වාක්‍ය සඳහා ලකුණු පිරිනමන්න.

(ල 1 x 5 = 5)

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..